# තෙවන තේමාව - දේව පණත් පිළිපදිමින් නීතිගරුක හා සදාචාර සම්පන්න ජීවිතය

21

## 3.5. සත්‍යය හා සාධාරණත්වය සුරකිමු

8 වන පණතට විරුද්ධ
සමාජ පුවත

අද ජාත්‍යන්තර වශයෙන් පවත්නා සමාජ විරෝධි ක්‍රියා බොහොමයක් රූපවාහිනිය, පුවත්පත් හා සඟරා මගින් දැන ගන්නෙමු. ගුවන් විදුලිය මඟින් අසන්නෙමු. ඒවා කිහිපයක් නම්

- අල්ලස් හා දූෂණ
- අනුන් නොමග යවන කථා
- අසත්‍ය තොරතුරු ප්‍රචාරය ආදිය ය.

- සමාජය තුළ සත්‍යවාදී වීමේ අවශ්‍යතාව පැහැදිලි කරන්න.

....................................................................................................................................

- සමාජ විරෝධී ක්‍රියාවන්ට විසඳුම් සොයන ආකාර තුනක් ලියන්න.

....................................................................................................................................

....................................................................................................................................

....................................................................................................................................


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

නුඹේ අසල්වැසියාට විරුද්ධව බොරු සාක්ෂි නො කියන්න.

(ද්වි. නීති සංග්‍රහය 5:20)

සමාජ සාරධර්ම ගොඩනැගෙන දස පණතෙහි අට වන පණත තුළින් සත්‍යවාදී ව ජීවත් වෙමින් සත්‍යයට සාක්ෂි දැරිය යුතු බව පෙන්වා දෙයි. බොරු කීම තුළින් සමාජ විනාශයක් ඇති කළ හැකි ය. සත්‍යය දැක දැක නිහඬ වීම, අසත්‍ය තොරතුරු ප්‍රචාරණය, නැති දේ මවාපාමින් ගතු කේලම් කිම, ඕපා දූප සෙවිම, නිළ රහස් හෙළි කිරීම, අනුන් නොමඟ යවන කථා ආදිය තුළින් සමාජය විනාශ මුඛයට ඇද දැමිය හැකි ය.

එ බැවින් මේවාට ගැති නො වී සත්‍යවාදී ව, තිර අධිෂ්ඨානයකින් යුතු ව ක්‍රියා කිරීම තුළින් අට වන පණත අනුව ජීවත් වීමට ඔබට හැකි වේ.

විභාගයෙන් වැඩි ලකුණු ගැනීමට මෙම පෙති ......

ඔබගේ ශරීර ජවය වැඩිකර ගැනීමට මෙම බීම .......

**මෙවැනි දැන්වීම් තුළින් නිරූපණය වන්නේ කුමක්ද යි ඔබ සිතා බැලුවෙහි ද?**

අපගේ ප්‍රචාරක මාධ්‍යයන් මගින් ප්‍රචාරය වන නොයෙකුත් දැන්වීම්, පුවත් ආදිය නිසා අද සමාජය පරිහානියට ලක් වී ඇත. බොහෝ තරුණ තරුණියන් නොමඟ යාමට එය හේතුවක් වී ඇත.

ජන මාධ්‍ය මගින් සත්‍ය ප්‍රචාරය කළ යුතුය. ජනමාධ්‍ය මගින් උගත් දැනුවත් තරුණ පරපුරක් ද විශ්ව ගම්මානය තුළ යහපත් දැහැමි පිරිසක් ද වීමට මඟ පෙන්විය යුතු ය.

දෙවි සමිඳාණන් වහන්සේ ඔබට දෙන සැම නගරයක් තුළ ම, ගෝත්‍රයක් ගෝත්‍රයක් පාසා විනිශ්චයකාරයන් සහ නිලධාරීන් පත් කළ යුතු ය. ඔවුන් ද සාධාරණ ලෙස සෙනඟ විනිශ්චය කළ යුතු ය. ඔවුන් අසාධාරණ ලෙස විනිශ්චය නො කළ යුතු ය. ඔවුන් මිනිසුන්ගේ තරාතිරම් නො බැලිය යුතු ය. අල්ලස් නොගත යුතු ය.

(ද්වි. නීති සංග්‍රහය 16:1820)

- දෙවි සමිඳාණන් දෙන නගරය තුළ දී කුමක් කළ යුතු ද?
- විනිශ්චයකාරයන් හා නිළධාරීන් නො කළ යුත්තේ කුමක් ද?
- දෙවි සමිඳාණන් වහන්සේ දෙන දේශයේ ජීවත් විය හැක්කේ කාට ද?

ඉහත දෙන ලද පාඨය තුළින් ස්වාමීන් වහන්සේ නායකත්ව ලක්ෂණ අපට පෙන්නුම් කරන සේක. නායකත්වය දරන්නන් අසාධාරණ විනිශ්චයන් නො කළ යුතු ය. මිනිසුන්ගේ තරාතිරම්, ජාති, ආගම්, කුල නොබැලිය යුතු ය. අල්ලස් නොගත යුතු ය. අසාධාරණ විනිශ්චයන් තුළින් සාධාරණත්වය නො ලබන නිසා සමාජයේ, මානසික පීඩන, දූෂණය, ත්‍රස්තවාදය, මිනී මැරුම් ආදිය උග්‍ර වේ.

**යුක්ති සහගත ව ජීවත්වීමෙන්**
**දේව රාජ්‍යය**
**උරුම කරගත හැකි ය.**

> . . . . ඔබ මාගේ ධර්මයෙහි පිහිටා පවතින්නාහු නම්, සැබවින්ම ඔබ මාගේ ගෝලයෝ ය; ඔබ සත්‍යය අවබෝධ කර ගන්නාහු ය; සත්‍යය ඔබ නිදහස් කරන්නේ ය.
>
> (ජොහාන් 8:3132)

මනුෂ්‍යයා දේව නිර්මාණයක් වන හෙයින් අප එකිනෙකා සත්‍යවාදී ව සිටිය යුතු ය. අප සැම ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රී ශරීරයේ අවයවයන් වන හෙයින් අසත්‍ය ප්‍රතික්ෂේප කර සත්‍යයට මුල් තැන දෙමින් ජීවත් විය යුතු ය. ඒ බව පාවුලු තුමා ද එපීස ලිපිය තුළින් මෙලෙස පවසයි.

> එබැවින් බොරු කීම අත්හැර දමා අසල්වාසී එකිනෙකා සමග සත්‍යය කතා කරන්න. මන්ද, අපි එකිනෙකා අන්‍යොන්‍ය අවයවයෝ වෙමු.
>
> (එපීස 4:25)

බොරු සාක්ෂි නොකියන්න.
අටවන දේව පණතයි.

**"ඇත්ත කියන්නත්, බිම ඉඳගන්නත් බය වෙන්න එපා."**

මෙම ගැමි ව්‍යවහාරය තුළින් ද සත්‍යය පැවසීමට අප එඩිතර විය යුතු බව පෙන්වා දෙයි.

## මෙනෙහි කිරීම සඳහා දේව වාක්‍යය

"මාගේ සහෝදරයෙනි, ඔබගෙන් බොහෝ දෙනෙක් ගුරුවරුන් වීමට නොසිතන්න. ඔබ දන්නා පරිදි ගුරුවරුන් වන අපි වඩාත් බරපතල මිම්මකින් විනිශ්චය කරනු ලබමු. අපි සියල්ලෝ ම බොහෝ විට වරදට වැටෙමු. යමෙක් වචනයෙන් වරදක් නො කරන්නේ නම්, ඔහු මුළු ශරීරය දමනය කරන්නට සමත්, සර්ව සම්පූර්ණ මනුෂ්‍යයෙකි. අශ්වයන් කීකරු කරගන්න පිණිස උන්ට කටකලියා දමූ විට අපි උන්ගේ මුළු ශරීරය ම දමනය කර ගනිමු. නැව් ගැන සිතන්න, නැවක් කොතරම් විශාල වුව ද, සැඩ සුළඟකට ගසාගෙන යන විට, ඉතා කුඩා සුක්කානමකින් නැව්පතියා එය  තමා රිසි සේ හරවාගෙන යයි. එලෙස ම දිව කුඩා අවයවයක් වුව ද එය ලොකුවට පුරසාරම් දොඩයි. කුඩා ගිනි පුපරකින් කොපමණ මහත් ලැව් ගින්නක් හටගනී ද? දිව ද ගින්නකි. එය අපේ ඉඳුරන් අතර, අදමිටුකමින් පිරුණු ලෝකයකි. එය මුළු ශරීරය දූෂණය කොට නිරා ගින්නෙන් සකල ලෝකය ම ගිනි දල්වයි. සියලු ආකාර වන මෘගයන් ද කුරුල්ලන් ද උරග ජාතින් ද මුහුදු සතුන් ද පෙර මෙන් දැනුත් මිනිසාට දමනය කළ හැකි ය. එහෙත් දිව දමනය කිරීම කිසිවකුට නො පුළුවන. එය හික්මවිය නොහැකි විෂඝෝර නපුරු  ඉන්ද්‍රියයකි. එයින් අපි ස්වාමින් වන පියාණන් වහන්සේ පසසමු. එයින් ම දිව්‍ය සමානත්වයෙන් මවන ලද මනුෂ්‍යනට සාප කරමු. ප්‍රශංසාවත්, සාපයත් එකම මුඛයෙන් නික්මෙයි. මාගේ සහෝදරයෙනි, මෙසේ වීම හරි නැත. දිය උල්පතේ එක සිදුරෙන් මිරිදියත්, කරදියත් නික්ම එයි ද?"

(ජාකොබ් 3:111)

වැඩිදුර අධ්‍යයනය සඳහා ...

**සත්‍යය සැඟවීම,**
**අසත්‍ය දේ ප්‍රකාශ කිරීම,**
**මේ පණිත තහනම් කරයි.**

**බොරු කීම, කේලම් කීම,**
**බොරු චෝදනා කිරීම, බොරුවට දිව්රීම**
**ආදී පාප මේ පණිතට විරුද්ධ වේ.**

**සත්‍යය තුළ ජීවත් වීමටත්, ජීවිත මඟින් සත්‍යයට සාක්ෂි දැරීමටත්,**
**අට වන පණිතින් අප සැම කැඳවන්නේ ය. සත්‍යවාදී නොවී**
**කිසිවකුට සංසයක ජීවත්විය නොහැකි ය.**
**සංසයක හෝ පවුලක ජීවත් වීමට සත්‍යවාදී බව හා**
**එකිනෙකාට විශ්වාසවන්ත වීම ඉතා වැදගත් වේ.**

**සත්‍යවාදී තැනැත්තා ප්‍රකාශ කළ යුත්තේ කුමක් ද?**
**රහසක් ලෙස තබාගත යුත්තේ කුමක් ද**
**යන්න හොඳින් දනී. ඒ තැනැත්තා අවංක හා ස්ථානෝචිත**
**ප්‍රඥාවෙන් යුතු ව කටයුතු කරයි.**
**සත්‍යය මත පදනම් වූ ප්‍රවෘත්ති දැන ගැනීමට සියලු දෙනාට**
**අයිතිවාසිකමක් ඇත.**

**සත්‍ය තොරතුරු දැන ගැනීමට ඉමහත් ආශාවක් දක්වන ජනතාවට**
**ඔවුන්ගේ උදාරත්වයට හා අයිතිවාසිකම්වලට නිසි ගෞරවය දක්වමින්**
**සත්‍ය ප්‍රකාශ කිරීම ජන මාධ්‍යයේ වැදගත් යුතුකමක් වේ.**
**ඒවාට ඇහුම්කන් දෙන ජනතාව ප්‍රකාශ කරන ප්‍රවෘත්ති ගැන**
**අවදි ව සිටීමට හා බොරු ප්‍රවෘත්ති ප්‍රකාශ කරන විට**
**ඊට විරුද්ධ ව ක්‍රියාකිරීමට වග බලා ගත යුතු ය.**

**අප ආලෝකවත් කර, අපගේ හෘද සාක්ෂියට**
**සමාජයීය සදාචාරාත්මක හා දේශපාලනමය ප්‍රශ්න කෙරෙහි**
**සාධාරණ අවබෝධයක් ලබාදීම, හරි මග යැවීම**
**මාධ්‍යවේදීන්ගේ යුතුකම වන්නේ ය.**

**(ක.ස.ධ. 2464 2513)**

සත්‍යයේ හා සාධාරණත්වයේ සමාජයක් ගොඩනැඟීමට උත්සාහ කරන විට දිව දමනය ඉතා වැදගත් ය. අපගේ දිව මගින් මුළු ලෝකය ම ගිනි ජාලාවක් බවට පත් කළ හැක.

බොරු සාක්ෂි කීමට දිවට ඉඩ නො දිය යුතු ය. දිව ආධාර කරගත් අපගේ වචනවලින් පිට වන්නේ අප ඇතුළාන්තයේ ඇති දෑ ය. අප තුළ යහපත් ගුණ ධර්ම ගොඩ නඟා ගැනීම තුළින් අපට දිව දමනය කළ හැකි ය.

මානෙල් සුවඳමය කුඩමසු පිළී ගඳමය

දෙකට ගුරු ජලමය හොඳට නරකට දෙකට කටමය

**කතෝලික සභා ධර්මෝපදේශයට අනුව අට වන පණතින් අපට නියෝග කරනුයේ,**

- සත්‍යවාදී වන දෙවියන් වහන්සේට දේව දරුවන් සත්‍යවාදී සාක්ෂිකරුවන් විය යුතු ය.
- දෙවියන් වහන්සේ සත්‍යවාදී වන හෙයින් ඔවුන්වහන්සේගේ ජනතාව ද සත්‍යවාදී වීටමට කැඳවනු ලබන්නෝ ය. ඒ කැඳවීම අනුව ඔවුන් ජීවත්විය යුතු යි.
- මිනිසා එකිනෙකා හා සත්‍යවාදී ව ජීවත් විය යුතු ය.

**පිළිතුරු සපයන්න.**

1. ඉහත සඳහන් කතෝලික සභා ධර්මෝපදේශ පාඨයන්ට අනුව සත්‍යයට විරෝධී වන ක්‍රියා හතරක් ලියන්න.

   1. ........................................................................................................................
   2. ........................................................................................................................
   3. ........................................................................................................................
   4. ........................................................................................................................


2. සත්‍යවාදී සමාජයක ලක්ෂණ තුනක් ලියන්න.


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

3. සත්‍යයට විරුද්ධ ව ඇති ක්‍රියාවලින් වැළකී සිටිය හැකි ආකාර හතරක් පෙන්වා දෙන්න.

**ඔබේ ජීවිතයට...**

**දෙවි පියාණන් සත්‍ය හා සාධාරණ වන බැවින් ඔබ ද එලෙස සත්‍යවාදී ව ජීවත්වන්නට අදිටන් කරගන්න.**




එපිස 6 : 14 - 17